## ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

### දෙවන වාර පරීක්ෂණය - 2018

| 08 ශ්‍රේණිය | නර්තනය I - II | කාලය පැය 01 |
|---|---|---|

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

- **අංක 01 සිට 05 දක්වා ඇති ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු හිස්තැන මත ලියන්න.**

1. නර්තනය මාධ්‍යයෙන් චරිත නිරූපණයේ දී එම සත්ත්වයන්ගේ .............................. නිරීක්ෂණය මූලික වේ.
2. පස්වන පා සරඹයේ නාමය .............................. නමින් හැඳින්වේ.
3. දේශීය නර්තන කලාව පිළිබඳ කරුණු අනාවරණය කරගත හැකි මූලාශ්‍රයකි ..............................
4. සවරං නැටුමේදී අතට ගන්න මෙවලම .............................. යි.
5. පුරා දින 09 තිස්සේ පවත්වනු ලබන හින්දු ආගමික උත්සවය .............................. නමින් හඳුන්වයි.

- **ප්‍රශ්න අංක 06 - 10 දක්වා දී වාක්‍ය හිරි නම් (✓) ලකුණද වැරදි නම් (×) ලකුණද යොදන්න.**

6. "සත් වෙත් මහත් අදර-ලත් යුත් සිදත් කුමරු......" මෙය උඩරට වෛරෝඩි වන්නමේ කවියකි. (    )
7. ඝෝෂක බෙරය යනු පහතරට බෙරයට බෙරයට තවත් නමකි. (    )
8. උඩරට පා සරඹ පහතරට සම්ප්‍රදායේදී ඉලංගම් හරඹ නමින් හැඳින්වේ. (    )
9. "සූරිය කුල ඇති හිරු දෙවියන්නේ" යනු පතුරු නැටුමේ කවියකි. (    )
10. "රුංතක පිංතක තරිකිට කුන්දත්" කස්තිරම් ආරම්භ වනුයේ හයවන ගොඩ සරඹයේ සිටය. (    )

- **ප්‍රශ්න අංක 11 සිට 20 දක්වා දී ඇති වරණ තුළින් වඩාත් නිවැරදි වරණය තෝරා යටින් ඉරක් අඳින්න.**

11.නම්‍යතා අභ්‍යාස කිරීම මඟින් ඉගෙන ගන්නා සම්ප්‍රදායට සුදුසු පරිදි වර්ධනය කරගත හැක්කේ,

I. අංග, ප්‍රත්‍යාංග, උපාංග වීහිටුවීම.
II. රසවින්දනය ඇති කිරීම.
III. ගායනය කිරීමට හැකිවීම.
IV. ශරීරයේ ස්ථූලතාව පාලනය.

12. උඩරට සම්ප්‍රදායේ ෂතර බීජාක්ෂර වනුයේ

I. තත්,දිත්,තොං,නං
II. තත්,පිත්,තොං,නං
III. තත්,පිත්,තොං,දිගතං
IV. තත්,දොං,දිං,නං

13. ඇම්බැක්කේ දේවාලයේ දක්නට ලැබෙනුයේ,

I. ගල් කැටයම් II. ලී කැටයම්
III. පිත්තල කැටයම් IV. රිදී කැටයම්

14. නවරාත්‍රී උත්සවයයේ පුද ලබන ප්‍රධාන කාන්තා දෙවිවරු තිදෙනා,

I. කාලී,ලක්ෂ්මී, පාර්වතී

II. රාධා, ක්‍රිෂ්ණා, පාර්වතී

III. කාලි, සරස්වතී, දුර්ගා

IV. දුර්ගා, ලක්ෂ්මී, සරස්වතී

15. "කාලි අම්මාන්" යනුවෙන් හඳුන්වනුයේ,

I. දුර්ගා දේවියයි. II. ලක්ෂ්මී දේවියයි.

III. සරස්වතී දේවියයි. IV. පත්තිනි දේවියයි.

16. පහතරට බෙරයේ කඳ සැකසීමට යොදා ගන්නා දැව වර්ග වනුයේ,

I. රබර්,හල්මිල්ල,තේක්ක

II. තේක්ක,කොස්,නැඳුන්

III. කිතුල්,ඇහැල,කොහොඹ

IV. හල්මිල්ල,ගංසූරිය,පොල්

17. නර්තන මධ්‍යයෙන් සත්ව චරිත නිරූපණය පහසුවෙන් ඉදිරිපත් කළ හැකි සතුන් කිහිපදෙනෙකි.

I. මොණරා,අලියා,අශ්වයා,කුකුලා

II. පරවියා,පූසා,ගොළු බෙල්ලා,කුකුලා

III. අශ්වයා, ගෙම්බා,උකුස්සා,සිංහයා

IV. බූරුවා,අශ්වයා,පිඹුරා,අලියා

18. පතුරු නැටුමට යොදා ගන්නා පතුරෙහි දිග ප්‍රමාණය,

I. අඟල් 15-18 අතර

II. අඟල් 15-20 අතර

III. අඟල් 18-36 අතර

IV. අඟල් 10-13 අතර

19. වෛරෝඩි වන්නමේ කවි ගායනයෙන් ඉදිරිපත් වනුයේ,

I. අශ්වයකුගේ හැසිරීම් රටාවයි.

II. තෙරුවන් සරණ පිළිබඳවයි.

III. කෙහෙතු විමනේ පිහිටි වෛරෝඩි මාණික්‍ය පිළිබඳවයි.

IV. සුරාසුර යුද්ධය පිළිබඳවයි.

20. නර්තන අංගයක සුන්දරත්වය වඩාත් තීව්‍ර කරගත හැක්කේ,

I. අලංකාර පද නිර්මාණ යොදා ගැනීමෙනි.

II. ගොඩ සරඹ පද නැටීමෙනි.

III. පා සරඹ නැටීමෙනි.

IV. ගැමි නැටුම් නැටීමෙනි.

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. එය ඇතුළු ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

01. ඔබ පන්ති කාමරයේදී ගොප් ගෙඩියක් නිර්මාණය කළ ආකාරය මතකයට නඟමින් පහත ප්‍රශ්න සඳහා පිළිතුරු ලියන්න.

I. ගොප් ගෙඩියක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය 2ක් නම් කරන්න.

II. එය කණ්ඩායමක් වශයෙන් නිර්මාණය කිරීමට යාමේදී ඇති වූ ගැටළු 2ක් ලියන්න.

III. කණ්ඩායම් ක්‍රියාකාරකම කිරීමේදී අනුගමනය කළයුතු සාරධර්ම 2ක් ලියන්න.

IV. ගොප් ගෙඩියක් භාවිතයට ගන්නා අවස්ථා 2ක් ලියන්න.

V. ගොප් ගෙඩිය නිර්මාණය කළ අයුරු කෙටියෙන් ලියන්න.

02. නර්තනය අතීතයේ සිටම මෙරට පැවති බවට ඓතිහාසික තොරතුරු විමර්ශනයේදී අපට හඳුනාගත හැකිය.

I. පුරා විද්‍යාත්මක මූලාශ්‍ර යටතේ රූකම් ගණයට ගැනෙන අංග 4 නම් කරන්න.

II. ආගමික අවස්ථා සඳහා නර්තනය යොදාගත් බවට සාධක 2ක් දක්වන්න.

III. එම සාධක අනුව එකල පැවති නර්තනය කෙසේදැයි කරන්න.

03. ද්‍රවිඩ ජනයාගේ ඉතාම උසස් ආගමික උත්සවයක් ලෙස නවරාත්‍රී උත්සවය හැඳින්විය හැකිය.

I. නවරාත්‍රී උත්සවය ලෙස නම් කිරීමට හේතුව ලියන්න.

II. පැවැත්වීමට හේතු 2ක් ලියන්න.

III. ආගමික පසුබිම චාරිත්‍රවිධි,සැරසිලි මින් කරණු 2ක් පිළිබඳව කෙටියෙන් විස්තරයක් කරන්න.

04. I. පතුරු හා සවරං කවිය බැගින් ලියන්න.

II. වෛරෝඩි වන්නමේ බෙර පදය කවියක් හා කස්තිරම ප්‍රස්ථාර කරන්න.

05. දේශීය බෙර වාදන හා දවුල් වාදන ක්ෂේත්‍රයට පොදුවූ වාදනයේ මූලික ධ්වනි 4කි.

I. ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් බෙර වාදනයේ මූලික බීජාක්ෂර 4ක් නම් කරන්න.

II. තත් හා පිත් අක්ෂර වාදනය වන ආකාරය ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අදාළව ලියන්න.

III. එහතරට බෙරයේ රූප සටහනක් ඇඳ කොටස් 4ක් නම් කරන්න.